# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
*General Certificate of Education (Adv.Level) Examination, 2023(2024)*

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I**
**Communication and Media Studies I**

**29 S I**

පැය දෙකයි
*Two hours*

**උපදෙස්:**

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (x) යොදා දක්වන්න.

1. ජංගම දුරකථන තිරය දෙසට ම මුහුණ යොමා එහි යතුරු පුවරුව වේගයෙන් හසුරුවමින් යෙහෙළිය සමග පණිවිඩ හුවමාරු කරන ගගනි දුටු ඔබට, වැඩිපුර ම සිහි විය හැකි සන්නිවේදනයේ ස්වභාවය වන්නේ,
   (1) සන්නිවේදනය අරමුණු සහගත බව යි.
   (2) සන්නිවේදනය බලය වන බව යි.
   (3) සන්නිවේදනය සංකේතාත්මක වන බව යි.
   (4) සන්නිවේදනය ඒකමාර්ගික මෙන් ම ද්විමාර්ගික වන බව යි.
   (5) සන්නිවේදනය සන්දර්භානුගත වන බව යි.

2. සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් සන්නිවේදනය පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් කළේ,
   (1) ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය යි.
   (2) ශැනොන් හා වීවර් ය.
   (3) චාල්ස් කූලි ය.
   (4) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.
   (5) ඇරිස්ටෝටල් ය.

3. දරුවන්ගේ සමාජ සම්බන්ධතා දුරස්වීම හා රූපවාහිනී භාවිතය අතර සබඳතාවක් පවතින බව අනාවරණය කළ මුල් ම පර්යේෂණය සිදු කරනු ලැබුයේ,
   (1) ජෝන් ඩූවී විසිනි.
   (2) වෝල්ටර් ලිප්මාන් විසිනි.
   (3) මහාචාර්ය විල්බර් ශ්‍රාම් විසිනි
   (4) යුනෙස්කෝ සංවිධානය විසිනි.
   (5) පෙන්සිල්වේනියානු විශ්වවිද්‍යාලයීය පර්යේෂණ කණ්ඩායම විසිනි.

4. ජනමාධ්‍යයේ කාර්යභාරය පිළිබඳ යුනෙස්කෝ " Many Voices One World" කෘතියෙහි හා හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ අර්ථකථනයෙහි දැක්වෙන පොදු කරුණ වන්නේ,
   (1) සුපරීක්ෂණය
   (2) අර්ථකථනය
   (3) සහසම්බන්ධය
   (4) පෙලඹවීම
   (5) ප්‍රවෘත්ති ලොව පුරා බෙදා හැරීම

5. සති අන්ත පුවත්පත සඳහා තමා විසින් ලියන ලද ලිපියෙහි අත්‍යවශ්‍ය ම කොටස් නොමැති බව දුටු බාසුරු තිලකරත්න මහතා දැඩි කණස්සල්ලට පත් විය. මෙම පුවත්පත් ලිපියෙහි කොටස් අඩු වීමට බලපෑ හේතුව විය හැකි වන්නේ,
   (1) නියාමන කාර්යය ක්‍රියාත්මක වීම යි.
   (2) බලපෑම් ක්‍රියාවලියට හසු වීම යි.
   (3) දොරටුපාලක සංකල්පය ක්‍රියාත්මක වීම යි.
   (4) පෙරහනු භාවිතය යි.
   (5) මාධ්‍ය විස්තාරණය යි.

6. සමාජයේ ජීවත් වන පුද්ගලයෙකු වශයෙන් මිනිසා විසින් ලබා ගන්නා පුරුදු හා හැකියාවන් ද සංස්කෘතියට අදාළ වන බව ප්‍රකාශ කළේ,
(1) බී. මැලිනොව්ස්කි ය.
(2) ඊ.බී. ටයිලර් ය.
(3) මාෂල් මැක්ලූහන් ය.
(4) සැමුවෙල් පුෆෙන්ඩෝර්ෆ් ය.
(5) මාර්කස් ටුලිස් සිසරෝ ය.

7. "පළමුවන වේදිකාවට දන් පැමිණි උඩරට මැණිකේ ශීඝ්‍රගාමී දුම්රිය කොළඹ කොටුවෙන් පිටත් වීමට මිනිත්තු 30ක් පමණ ප්‍රමාද වන බව කරුණාවෙන් සලකන්න. "
දුම්රිය බලාපොරොත්තුවෙන් සිටි මගීන්ට මෙම පණිවිඩය ග්‍රහණය වීම වඩා හොඳින් විග්‍රහ කරන සන්නිවේදන නිර්වචනය වන්නේ,
(1) විල්බර් ශ්‍රාම්ගේ නිර්වචනය යි.
(2) ශැනොන් වීවර්ගේ නිර්වචනය යි.
(3) හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ නිර්වචනය යි.
(4) එඩ්වඩ් සැපීර්ගේ නිර්වචනය යි.
(5) චාල්ස් එච්. කූලිගේ නිර්වචනය යි.

8. කවිඳු, වෙබ් අඩවි පරිශීලනයෙන් පාසල් අධ්‍යාපනික ව්‍යාපෘතියක් සඳහා තොරතුරු රැස් කර ගන්නා ආකාරය රවිඳුට පැහැදිලි කළේ ය. මෙහි දී සිදුවන සන්නිවේදන කාර්යය වන්නේ,
(1) පෙලඹවීම යි.
(2) උපදෙස් සම්පාදනය යි.
(3) විනෝදාස්වාද සම්පාදනය යි.
(4) තොරතුරු සම්පාදනය යි.
(5) සහසම්බන්ධය යි.

9. වඩා තීව්‍ර සන්නිවේදනයකට අවකාශය සැලසෙන්නේ පහත කුමන සන්නිවේදන වර්ගය යටතේ ද?
(1) මහජන සන්නිවේදනය තුළ ය.
(2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය තුළ ය.
(3) අන්තර් පුද්ගල සන්නිවේදනය තුළ ය.
(4) සමූහ සන්නිවේදනය තුළ ය.
(5) ජන සන්නිවේදනය තුළ ය.

10. ජනසන්නිවේදනය පිළිබඳ පිළිගත **නොහැකි** ප්‍රකාශය කුමක් ද?
(1) විධිමත් ආයතනගත ක්‍රියාවලියකි.
(2) සමජාතීය ග්‍රාහක ක්ෂේත්‍රයක් ඇත.
(3) බහුවිධ දොරටුපාලකයින් ඇත.
(4) ප්‍රතිපෝෂණය ප්‍රමාදිත වේ.
(5) වෘත්තීය සන්නිවේදකයින් සම්බන්ධ වේ.

11. ඩබ්ලිව්. ජේම්ස් පොටර්ගේ අර්ථ දැක්වීම අනුව,
(1) අප කොතරම් දුරට මාධ්‍යයට විවෘත ද යන්න පිළිබඳ පර්යාලෝකය ද මාධ්‍ය සාක්ෂරතාවට අයත් වේ.
(2) මාධ්‍ය මගින් සෑම ආකාරයෙන් ම ලැබෙන සන්දේශ පරිහරණය කිරීම මාධ්‍ය සාක්ෂරතාවට අයත් වේ.
(3) මාධ්‍ය සන්දේශ පරිහරණය හා විශ්ලේෂණය පිළිබඳ කුසලතාව මාධ්‍ය සාක්ෂරතාවට අයත් ය.
(4) මාධ්‍ය සන්දේශ අර්ථකථනය හා නිර්මාණය කිරීමට ලබා ගන්නා හැකියාව මාධ්‍ය සාක්ෂරතාවට අයත් ය.
(5) ස්වකීය සන්දේශ නිර්මාණය කර ගැනීම සඳහා මාධ්‍ය භාවිත කිරීමේ කුසලතාව මාධ්‍ය සාක්ෂරතාවට අයත් ය.

12. A – සන්දේශ අන්තර්ගතය අර්ථකථනය කරගැනීම
B – සිතුවිලි සන්දේශ බවට පරිවර්තනය කරගැනීම
C – අපේක්ෂිත පාර්ශව වෙත සන්දේශ රැගෙන යාම
D – ආකල්පමය හෝ චර්යාමය වෙනසක් ඇති කිරීම

ඉහත A B C D අනුපිළිවෙළින් ගැළපෙන වරණය වන්නේ,
(1) සන්නිවේදකයා, සන්දේශය, මාධ්‍ය, ග්‍රාහකයා
(2) ආකේතකරණය, විකේතකරණය, මාධ්‍ය, බලපෑම
(3) සන්දේශය, විකේතකරණය, නාලිකාව, ප්‍රතිපෝෂණය
(4) විකේතකරණය, ආකේතකරණය, නාලිකාව, බලපෑම
(5) ප්‍රතිපෝෂණය, ආකේතකරණය, නාලිකාව, ඝෝෂාව

13. පලිබෝධ හානි ආදියෙන් සිදුවන විනාශයෙන් ඒවා ආරක්ෂා කර ගැනීමත් මිනිසුන්ට වැළඳෙන ව්‍යාධි වසංගත හා අපල උපද්‍රවවලින් ආරක්ෂා වීමත් විනෝදාස්වාදය ලබා ගැනීමත් අපේක්ෂාවෙන් උඩරට ප්‍රදේශවල පවත්වනු ලබන ගැමි නාටක විශේෂය වන්නේ,
(1) කෝලම් ය.
(2) රූකඩ ය.
(3) නූර්ති ය.
(4) නාඩගම් ය.
(5) සොකරි ය.

14. බොහෝ පිරිසකගේ සිට එක් අයෙකු වෙත සන්දේශ යොමු කෙරෙන නව මාධ්‍ය සම්බන්ධ තොරතුරු හුවමාරු කාණ්ඩය වන්නේ,
(1) විද්‍යුත් තැපැල (Email)
(2) අන්තර්ජාල පළ කිරීම් (Web Post)
(3) බ්ලොග් (Blogging)
(4) මාර්ගගත පෙත්සම් (Online Petition)
(5) ට්විටර් (Twitter)

15. සමාජය, සංස්කෘතිය හා පුද්ගලයා සම්බන්ධව **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) පුද්ගලයාගේ හැඩගැස්මට සංස්කෘතිය හා සමාජය බලපෑම් කරනු ලබයි.
(2) සමාජයටත්, පුද්ගලයාටත්, සංස්කෘතියෙන් තොරව පැවතිය නොහැකි ය.
(3) පුද්ගලයා සමාජයට අනුගත වීම සඳහා සංස්කෘතිය බලපාන්නේ අල්ප වශයෙනි.
(4) සමාජය, සංස්කෘතිය හා පුද්ගලයා යනු අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වයක් සහිත සංරචක වේ.
(5) සමාජය හා පුද්ගලයා සම්බන්ධ ව සංස්කෘතියේ භූමිකාව සමාජ පැවැත්මට ඍජු සම්බන්ධයක් පවතී.

16. අභිසාරීතාව යන්නෙහි අර්ථය දක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,
(1) තොරතුරු ජාලා එකිනෙක සම්බන්ධ වීම යි.
(2) බින්දුව හා එක යන කේත ඇසුරින් දත්ත නැවත සකස් වීම යි.
(3) විද්‍යුත් සබඳතා භාවිත කරමින් එක් පර්යනයක් වෙත ළඟා වීමට ඇති සබඳතාව යි.
(4) නව සන්නිවේදන තාක්ෂණය හේතුවෙන් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය එක ම තලයක දී ඒකාබද්ධ වීම යි.
(5) අංකිත තාක්ෂණ ඔස්සේ තොරතුරු පහසුවෙන් පිටපත් කර අඩු පිරිවැයක් යටතේ බෙදා හැරීම යි.

17. "සංස්කෘතිය යනු ප්‍රකෘතියේ විකෘතිය යි." මින් අදහස් වන්නේ,
(1) සංස්කෘතිය යනු ප්‍රකෘතියේ වෙනස් වීමක් බව යි.
(2) ප්‍රකෘතිය යනු සංස්කෘතියේ විකෘතියක් බව යි.
(3) සංස්කෘතිය සහ ප්‍රකෘතිය සමාන්තර වචන බව යි.
(4) සංස්කෘතිය සමාජ නියමයන් නොසලකා හරින බව යි.
(5) සංස්කෘතිය මානව අවධානයට ලක් වෙමින් ප්‍රකෘතිය වන බව යි.

18. "පුද්ගලයාගේ සමාජ ජීවිතයේ වැදගත් ම හා කේන්ද්‍රීය ම සාධකය සන්නිවේදනය යි." මෙම අදහස ඉදිරිපත් කළ විද්‍යාඥයන් තිදෙනා වන්නේ,
(1) වෝල්ටර් ලිප්මන්, ජෝන් ඩූවී හා විල්බර් ශ්‍රාම් ය.
(2) වොල්ටර් ලිප්මන්, චාල්ස් හෝර්ටන් කූලී සහ ජෝන් ඩූවී ය.
(3) ජෝන් ඩූවී, හැරල්ඩ් ඩී. ලැස්වෙල් හා චාල්ස් හෝර්ටන් කූලී ය.
(4) හැරල්ඩ් ඩී. ලැස්වෙල්, ක්ලෝඩ් ශැනොන් හා විල්බර් ශ්‍රාම් ය.
(5) චාල්ස් හෝර්ටන් කූලී, ජෝන් ඩූවී සහ එඩ්වඩ් සැපීර් ය.

19. මාධ්‍ය අධ්‍යාපනය ලෙස හඳුන්වන්නේ,
(1) විචාරශීලී ග්‍රාහකත්වය ඔප්නැංවීමේ ක්‍රියාවලිය යි.
(2) සන්දේශ සම්ප්‍රේෂණය හා ග්‍රහණය විධිමත් කරලීම යි.
(3) මාධ්‍ය පිළිබඳ ග්‍රාහක සමාජය දැනුවත් කිරීමේ ක්‍රියාවලිය යි.
(4) විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පරිහරණය පිළිබඳ දැනුම්වත් කිරීමේ ක්‍රියාවලිය යි.
(5) පුද්ගලයා මාධ්‍ය සාක්ෂරතාවෙන් යුක්ත අයෙක් බවට පත්කරලීමේ ක්‍රියාවලිය යි.

20. නිරන්තරයෙන් වෙනස් වන සමාජ තත්ත්වයන්ට හා කොන්දේසිවලට සවිඥානිකව හැඩගැසීමේ ක්‍රියාවලිය,

(1) අනුකලනය වීම යි. (2) සංජානනය යි.
(3) සමාජානුයෝජනය යි. (4) සවිඥානිකභාවය යි.
(5) සංස්කෘතික ප්‍රගමනය යි.

21. ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණයක් **නොවන්නේ,**

(1) වාණිජමය ස්වරූපයක් ගැනීම යි. (2) පහසුවෙන් පරිහරණය කළ හැකි වීම යි.
(3) කුඩා පරිමාණ නිෂ්පාදනයක් සිදු නොවීම (4) නොගැඹුරු ස්වභාවයෙන් යුක්ත නොවීම යි.
(5) විශේෂ බුද්ධිමය සහ අධ්‍යාපන මට්ටමක් අවශ්‍ය නොවීම යි.

22. සන්නිවේදන ආකෘති සම්බන්ධයෙන් පහත A හා B කොටස් නිවැරදිව අනුපිළිවෙලින් ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| 1. චක්‍රීය සන්නිවේදන ආකෘතියක් වන අතර ප්‍රතිපෝෂණය ද ඇතුළත් වීම | A ශැනන් හා වීවර් ආකෘතිය |
| 2. සම්ප්‍රේෂණ හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය විග්‍රහ කළ ආකෘතියක් වීම | B හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය |
| 3. සන්නිවේදන ක්‍රියාවලියේ දී සිදුවන බලපෑම පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම | C ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතිය |
| 4. සන්නිවේදන ක්ෂේත්‍රයේ දොරටුපාලක සංකල්පය හා ග්‍රාහක ක්ෂේත්‍රය පිළිබඳ සඳහන් වීම | D ඇරිස්ටෝටල් ආකෘතිය |
| 5. සන්දේශය ලබා දීමට හේතුවන තත්ත්වය පිළිබඳ සඳහන් වීම | E හබ් ආකෘතිය |

(1) A B C D E (2) B C E A D
(3) D A C E B (4) C A B E D
(5) C A B D E

- අංක **23** හා **24** ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු පදනම් කර ගන්න.

A - පුද්ගල ස්ව කේන්ද්‍රය අවිඥානිකව ද ක්‍රියාත්මක ය.
B - ඥාන ව්‍යුහ තැන්පත් වී ඇත්තේ පුද්ගල මනසේ ය.
C - පුද්ගල ස්වකේන්ද්‍රය විඥානිකව ක්‍රියාත්මක වන විට මාධ්‍ය බලපෑමට හසු වේ.
D - තොරතුරු සහ දැනුම යනු එකිනෙකට සමාන පද දෙකකි.

23. මාධ්‍ය සාක්ෂරතාව සම්බන්ධයෙන් සැලකිලිමත් වීමේ දී මේ අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A පමණි. (2) A හා B ය.
(3) C හා D ය. (4) B හා D ය.
(5) B පමණි.

24. රාත්‍රී 7ට විකාශය වන ප්‍රවෘත්ති වැඩසටහන නැරඹීමට රූපවාහිනිය ඉදිරියේ හිඳගත් තරිඳුට හදිසියේ කළ යුතු කාර්යයක් සිහිගැන්වෙන විට වේලාව රාත්‍රී 9.30ත් පසු වී තිබිණි.
ඉහත A, B, C, D ප්‍රකාශ අතුරින් මෙම අවස්ථාවට වඩාත් ම ගැළපෙන්නේ,

(1) A පමණි. (2) C පමණි.
(3) B හා C පමණි. (4) A හා C පමණි.
(5) C හා D පමණි.

25.

A - සන්නිවේදනය තුළින් බලපෑමක් ඇති කිරීම

B - එක සමාන මනෝභාවයක් ඇති කිරීම

C - එක් තැනක දී තෝරාගත් පණිවිඩයක් තවත් තැනක දී ඒ අයුරින් ම ප්‍රතිනිර්මාණය කිරීම

D - මානව සබඳතා රඳවා වර්ධනය කිරීම

E - අදහස්, දැනුම යනාදිය භාෂණය, ලේඛනය හෝ සංඥා මගින් හුවමාරු කරගැනීම

ඉහත A, B, C, D හා E හි සඳහන් අදහස් දක්වන ලද විද්වතුන් අනුපිළිවෙළින් සඳහන් වන පිළිතුර වන්නේ,

(1) හැරල්ඩ් ඩී. ලැස්වෙල්, චාල්ස් එච්. කූලි, විල්බර් ශ්‍රාම්, ශැනොන් වීවර්, ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය
(2) හැරල්ඩ් ඩී. ලැස්වෙල්, විල්බර් ශ්‍රාම්, ශැනොන් වීවර්, චාල්ස් එච්. කූලි, ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය
(3) ශැනොන් වීවර්, විල්බර් ශ්‍රාම්, හැරල්ඩ් ඩී. ලැස්වෙල්, ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය, චාල්ස් එච්. කූලි
(4) චාල්ස් එස් කූලි, ශැනොන් වීවර්, විල්බර් ශ්‍රාම්, හැරල්ඩ් ඩී. ලැස්වෙල්, ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය
(5) විල්බර් ශ්‍රාම්, හැරල්ඩ් ඩී. ලැස්වෙල්, ශැනොන් වීවර්, ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය, චාල්ස් එච්. කූලි

26. "දත්ත ලබා ගැනීමට උපදෙස් ලබා දීම, ක්ෂණිකව තොරතුරු යාවත්කාලීන කිරීම සහ ප්‍රතිචාර දැක්වීම" මෙම කරුණු ඇතුළත් නව මාධ්‍යවල ලක්ෂණයකි.

(1) අංකිතකරණය
(2) අධිපාඨනීයත්වය
(3) ස්වයංකරණය
(4) අන්තර් ක්‍රියාකාරීත්වය
(5) වේගවත් සන්දේශකරණය

27. නිර්මාණ කාර්යය සඳහා අවශ්‍ය සංකල්ප හා චිත්ත රූප ගොඩනැඟීමට නිර්මාණකරුවෙක් සතු ශක්තිය,
(1) ව්‍යුත්පත්තිය යි.
(2) සතතාභ්‍යාසය යි.
(3) ප්‍රතිභාව යි.
(4) සංජානනය යි.
(5) පරිකල්පනය යි.

28. ශ්‍රී ලංකාවේ තොරතුරු අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස තහවුරු වූයේ,
(1) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙනි.
(2) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(1) හා 15(2) වගන්තිවලිනි.
(3) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 සිට 14 දක්වා වගන්තිවලිනි.
(4) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගිනි.
(5) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියෙනි.

- අංක **29** සිට **31** දක්වා වූ ප්‍රශ්න සඳහා පහත තොරතුරු භාවිත කරන්න.

A - එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය 51/172,1996

B - සිල්වියෝ වයිස්බෝඩ්

C - ශ්‍රීනිවාස් මෙල්කොට්

D - සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳ රෝම සම්මුතිය 2006

29. සංවර්ධනය සඳහා සන්නිවේදනය, සංවාදය සක්‍රිය කරවන හා එය මත පදනම් වූ ක්‍රියාවලියක් බව දක්වෙන්නේ,
(1) A හා D මගිනි.
(2) B හා C මගිනි.
(3) C හා D මගිනි.
(4) A හා B මගිනි.
(5) B හා D මගිනි.

30. ආගමික බැඳීම්වලින් තුන්වන ලෝකයේ විමුක්තිය ලබා ගැනීම සංවර්ධනය සඳහා සන්නිවේදනයට අදාළ කරුණක් ලෙස සඳහන් කරන්නේ,

(1) A පමණි. (2) B පමණි.
(3) C පමණි. (4) D පමණි.
(5) A, B, C හා D සියල්ලම ය.

31. කර්මාන්ත සංවර්ධන අංශය මගින් ස්වශක්තියෙන් නැගී සිටිමින් තමන්ගේ ම නිෂ්පාදන අලෙවි කරගැනීම සඳහා සරල සන්නිවේදන උපක්‍රම පිළිබඳ වතු ජනතාව දැනුවත් කෙරිණි.
උක්ත තොරතුරු අනුව සන්නිවේදන ක්‍රියාදාමයන් පිළිබඳ ඇතුළත් වන්නේ,

(1) A හා B පමණි. (2) C හා D පමණි
(3) A, B හා C පමණි. (4) B, C හා D පමණි.
(5) A, B, C, D සියල්ලෙහිම ය.

32. සමීක්ෂණයක් සඳහා ප්‍රශ්නාවලියක් භාවිත කිරීමේ දී නොකළ යුතු වන්නේ,
(1) පක්ෂපාතී පිළිතුරු අපේක්ෂාවෙන් තොරවීම
(2) මූලික අරමුණට ගැළපෙන සේ ප්‍රශ්න සැකසීම
(3) දත්ත දායකයාට පහසුවන ලෙස ප්‍රශ්න ඇසීම
(4) හැකි තරම් අවම ප්‍රශ්න ප්‍රමාණයක් තෝරා ගැනීම
(5) දත්ත දායකයාගේ සියලු තොරතුරු අනාවරණය කර ගැනීම

33. පහත රූපාවලිය දක්වෙන රූප රාමු සහිත වරණය තෝරන්න.
* ඩෙංගු මර්දන සතියේ පළමු දිනයේ පාසල් වත්තේ තැන තැන සෞඛ්‍ය නිලධාරීහු සිසු ගුරු කණ්ඩායම් දැනුවත් කරති.
* එක් සෞඛ්‍ය නිලධාරියෙක් ගුරු සිසු කණ්ඩායමට පින්තූරයක් පෙන්වමින් පැහැදිලි කරයි.
* ගුරුභවතෙක් සිසුන් දෙදෙනෙකුට ඩෙංගු මදුරුවෙකුගේ පින්තූරයක් පෙන්වයි.
* සිසුවෙක් මදුරු කීටයන් සහිත වතුර පිරුණු පොල් කටුවක් දක්වයි.
* පොල් කටුව තුළ මදුරු කීටයන් දඟලමින් සිටියි.

(1) මධ්‍යම රූපය, අති සමීප රූපය, දුර රූපය, ඉතා දුර රූපය, මධ්‍යම රූපය
(2) දුර රූපය, මධ්‍යම රූපය, අති සමීප රූපය, සමීප රූපය, මධ්‍යම සමීප රූපය
(3) අති දුර රූපය, අති සමීප රූපය, දුර රූපය, ඉතා දුර රූපය, මධ්‍යම රූපය
(4) මධ්‍යම රූපය, අති සමීප රූපය, දුර රූපය, ඉතා දුර රූපය, සමීප රූපය
(5) අති දුර රූපය, මධ්‍යම දුර රූපය, මධ්‍යම සමීප රූපය, සමීප රූපය, අති සමීප රූපය

34. මාධ්‍ය ප්‍රවණතා පිළිබඳ සැලකීමේ දී නිරන්තර ව වර්ධනය වන භාණ්ඩ හා සේවා අත්පත් කරගැනීම සඳහා දිරිමත් කෙරෙන සමාජ හා ආර්ථික ක්‍රියාවලියක් වන්නේ,

(1) පාරිභෝජ්‍යකරණය යි. (2) වාණිජකරණය යි.
(3) භාණ්ඩකරණය යි. (4) ගෝලීයකරණය යි.
(5) නිර්මහාපරිමාණකරණය යි.

35. මාධ්‍ය ආයතනයක් විසින් මෙහෙයවන ලද සජීවී ගායන වැඩසටහනකට ඉදිරිපත් වූ තරගකරුවෙකු ගැයූ පැරණි ගීතය, මුල් ගීතය ද අබිබවමින් යූ ටියුබයේ විශාල ආදායමක් ඉපයීම බොහෝ දෙනාගේ කතා බහට ලක් විය.
මෙය,

(1) හිමිකම් අයිතිය උල්ලංඝනය නොවන සාධාරණ භාවිතයකි.
(2) 1934 සන්නිවේදන පනත යටතේ නඩු පැවරිය හැකි අවස්ථාවකි.
(3) 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත යටතේ නඩු පැවරිය හැකි අවස්ථාවකි.
(4) 2016 තොරතුරු දැනගැනීමේ පනත යටතේ නව ගායකයාට දඬුවම් කළ හැකි අවස්ථාවකි.
(5) 1927 බ්‍රිතාන්‍ය රාජකීය ප්‍රතිපත්තිය යටතේ නිර්මාණකරුට වන්දි ගෙවිය යුතු අවස්ථාවකි.

36. සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂාවලට අදාළ කරුණු හා විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| 1. අවශ්‍යතා කේන්ද්‍රියත්වය | A මානව අභිප්‍රේරණය සහ පෞරුෂය පිළිබඳ අවබෝධය |
| 2. ස්වයංනිර්ණය | B ප්‍රජාතන්ත්‍රවාදී සවිඥානිකත්වය ඉහළ දැමීම |
| 3. ස්වයංවිශ්වාසය | C ආපදා සන්නිවේදන ක්‍රියාකාරකම් |
| 4. යහපත් පරිසරයක් ගොඩනැගීම | D මූලික අවශ්‍යතා හා මානව හිමිකම් ඉටු කර ගැනීම |
| 5. සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය | E තමා විසින් ම සංවර්ධන කරුණු විමසීම |

ඉහත කරුණු හා විස්තරය ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) 1B, 2C, 3A, 4E, 5D
(2) 1D, 2A, 3E, 4C, 5B
(3) 1E, 2D, 3C, 4B, 5A
(4) 1A, 2B, 3C, 4D, 5E
(5) 1C, 2B, 3A, 4D, 5E

37. මහජන සම්බන්ධතාව යන්නෙන් අදහස් වන්නේ,
(1) ආයතනයක අභ්‍යන්තර පාර්ශවයන් සමග සම්බන්ධතා පැවැත්වීම යි.
(2) කීර්තිමත් නාමයක් ඇති කිරීම සඳහා පුද්ගල අදහස් හා හැසිරීම්වලට බලපෑම් කිරීමයි.
(3) ලාභ ලැබීම අරමුණු කරගත් ව්‍යාපාරයක් විසින් තම දියුණුව උදෙසා භාවිත කරන උපක්‍රමය යි.
(4) ආයතනික හොඳ හිත හා මහජන ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍ය සමග සම්බන්ධතා පැවැත්වීම යි.
(5) රාජ්‍ය දෙකක් හෝ කිහිපයක් සමග ඇති කරගනු ලබන හා පවත්වාගෙන යනු ලබන යහපත් සම්බන්ධතාව යි.

38. සමකාලීන මාධ්‍ය ප්‍රවණතාවලට අයත් ප්‍රධාන ක්ෂේත්‍රයක් ලෙස සැලකිය **නොහැක්කේ,**
(1) ග්‍රාහකයා යි.
(2) අන්තර්ගතය යි.
(3) ආයතනික ප්‍රවණතා යි.
(4) තාක්ෂණික ප්‍රවණතා යි.
(5) ස්ත්‍රී පුරුෂ සමාජ තත්ත්වය යි.

39. සමීක්ෂණ භාවිතයේ ආවාසියක් වීමට වඩාත් ම හැකියාව ඇත්තේ,
(1) සාපේක්ෂ වශයෙන් වැයවන මුදල් ප්‍රමාණය අවම වීම යි.
(2) කෙටි කාලයක දී දත්ත රැස්කර ගැනීමට හැකියාව පැවතීම යි.
(3) ආකල්ප, මතවාද, විශ්වාස පිළිබඳ තොරතුරු ද එකවර රැස්කරගත හැකි වීම යි.
(4) දත්ත දායකයන් විශාල ප්‍රමාණයකින් වුව ද තොරතුරු රැස්කර ගැනීමට හැකි වීම යි.
(5) තොරතුරුවල ගුණාත්මකභාවය පිළිබඳ දත්ත දායකයාගේ මානසික ස්වභාවයේ බලපෑම යි.

40. මහජන සම්බන්ධතාව පිළිබඳ සෑම් බ්ලැක්ගේ නිර්වචනයට වඩාත් අදාළ ප්‍රකාශය දැක්වෙන වරණය තෝරන්න.

A සංවිධානයක් විසින් ඒ හා බැඳී පවතින මහජනතාව අතර හොඳ හිත හා අවබෝධය වර්ධනය කිරීම යි.

B යහපත් සිතින් යුතුව මානව සදාචාර සම්බන්ධතාව ඇති කිරීම සඳහා ගනු ලබන සියලු ආකාරයේ ක්‍රියාමාර්ග සමුදාය යි.

C කිසියම් සංවිධානයක් සම්බන්ධතා පවත්වන අභ්‍යන්තර හා බාහිර සියලු දෙනා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා පැවතීම යි.

D සම්බන්ධතා පවත්වන සියලු දෙනා අතර අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කරනු ලබන සෑම දෙයක් ම මහජන සම්බන්ධතාව යි.

(1) ABC (2) AC (3) BCD (4) CD (5) DAB

41. සමකාලීන මාධ්‍ය ප්‍රවණතාවල දැක්වෙන පරිදි ග්‍රාහකයා සම්බන්ධ **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) ග්‍රාහකයාට සක්‍රියව මාධ්‍ය අන්තර්ගතය ගොඩනැගීමට හැකියාව ඇත.
(2) ග්‍රාහකයා සක්‍රිය පාඨකයෙකු, අසන්නෙකු හා නරඹන්නෙකු බවට පත් කර ඇත.
(3) ග්‍රාහකයාට සෑමවිට ම නිරවද්‍ය සමබර හා විශ්වසනීය තොරතුරු ලබාගත හැකි ය.
(4) ග්‍රාහකයා නවීන තාක්ෂණ භාවිතයෙහි වැඩි නැඹුරුවක් දක්වනු දැකිය හැකි ය.
(5) මාධ්‍යයේ සිදු වූ තාක්ෂණික, ආයතනික හා අන්තර්ගත ප්‍රවණතා ඍජු ලෙස ම ග්‍රාහකයන්ගේ භූමිකාව වෙනස් වීමට බලපා තිබේ.

42. භාණ්ඩකරණය නම් මාධ්‍ය ප්‍රවණතාවට අනුව තොරතුරු යනු වෙළෙඳ භාණ්ඩයකි. ඒ අනුව පහත ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) කලාව, ආගම, ඖෂධ ආදියට ද මූල්‍ය වෙළෙඳපොළක් පවතී.
(2) මාධ්‍ය, අන්තර්ගතය අලෙවි කිරීම සඳහා පවතින අවකාශ සීමිත වේ.
(3) මානව නිර්මාණශීලීත්වයෙන් බිහිවන සංස්කෘතික අංගයකට ද වෙළෙඳපොළක් පවතී.
(4) මාධ්‍යයේ කාලය හා අවකාශය දූෂ්වීම්කරණය විසින් වෙළෙඳපොළක් බවට පත් කර තිබේ.
(5) දේශපාලනික කටයුතු වෙනුවෙන් භාවිත වන තොරතුරුවලට ද මූල්‍යමය වටිනාකමක් පවතී.

43. සරල බව, එක් වරකින් තේරුම් ගැනීමට හැකි බව, සවන කේන්ද්‍රීය එළඹුම, දිගු සංකීර්ණ වාක්‍ය යොදා නොගැනීම, අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයට අවකාශ සැලසීම, අත්දැකීම් පසුතලයට ආමන්ත්‍රණය කිරීම, යන කරුණු,
(1) ගුවන්විදුලි නාට්‍ය නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු වේ.
(2) ගුවන්විදුලි මාධ්‍යයේ ග්‍රාහක ආකර්ෂණයට හා පරිකල්පනයට හේතුවන සාධක වේ.
(3) ගුවන්විදුලි මාධ්‍යයේ සමස්ත වැඩසටහන් නිර්මාණශීලීත්වයට බලපාන ලක්ෂණ වේ.
(4) ගුවන්විදුලි මාධ්‍ය භාෂාවේ නිර්මාණශීලීත්වයට බලපාන කරුණු වේ.
(5) ගුවන්විදුලි මාධ්‍ය භාෂාවේ නිර්මාණශීලීත්වයට හා ආකර්ෂණයට බලපාන කරුණු වේ.

44. නැවුම් බලාපොරොත්තු සිත්හි දරා ගත් රටේ තාරුණ්‍යය, සමාජ මාධ්‍ය හරහා සංවිධානය වී ගම් දනව් සිසාරා සිතුවම් අඳිමින් පිබිදුණු දේශයක් නිර්මාණය කිරීමට දායක විය.
මෙහි දී සිදු වූ ප්‍රබල ම සන්නිවේදන කාර්යය විය හැකි වන්නේ,
(1) පෙලඹවීම යි.
(2) සුපරීක්ෂණය යි.
(3) සමාජානුයෝජනය යි.
(4) තොරතුරු සම්පාදනය යි.
(5) අධ්‍යාපනය ලබා දීම යි.

45. "විචාරශීලී ග්‍රාහකයා සක්‍රිය ග්‍රාහකයෙකි." සක්‍රිය මාධ්‍ය ග්‍රාහකත්වය යනු,
(1) නව තාක්ෂණය පිළිබඳ විමසා බැලීමකි.
(2) සමාජ සංස්ථාවලට අනුකූලව පුහුණු වීමකි.
(3) පුද්ගලයාට සහජයෙන් ලැබෙන කුසලතාවකි.
(4) මාධ්‍යයේ මායාව හා යථාර්ථය තේරුම් ගැනීමකි.
(5) විවිධ මාධ්‍ය සන්දේශ පරිහරණය කිරීමේ හැකියාවකි.

46. සමීක්ෂණ ක්‍රියාවලියක දී දත්ත හිතාමතා විකෘති කරන්නේ,
(1) දත්ත දායකයාගේ විශ්වාසය තහවුරු කිරීමට ය.
(2) බුද්ධිමය දේපළ අයුතු ලෙස භාවිත නොකිරීමට ය.
(3) දත්ත දායකයාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමට ය.
(4) සමීක්ෂකයාට යම් වාසි සහගත තත්ත්වයක් ඇති කර ගැනීමට ය.
(5) සමීක්ෂකයාගේ පෞද්ගලික මතය සමීක්ෂණයට අදාළ නොවීමට ය.

47. විචාරශීලී ග්‍රාහකයා සතු විය යුතු මාධ්‍ය සන්දේශයෙහි සමස්තයට ගළපමින් නව ප්‍රස්තුත ගොඩ නැගීමේ හැකියාව හඳුන්වන්නේ,
(1) අනුමානය ලෙස ය.
(2) සංස්ලේෂණය ලෙස ය.
(3) නිගමනය ලෙස ය.
(4) විශ්ලේෂණය ලෙස ය.
(5) වියුක්තිකරණය ලෙස ය.

48. සිය සහෝදරයා ජපානයට යාමට තීරණය කළ දා සිට හසිනි ජපන් සංස්කෘතිය ගැන දැන හඳුනාගැනීමට කුතුහලයෙන් පසු වූවා ය. ඇය අන්තර්ජාලයෙන් ජපානයේ ආහාර පාන, ජීවන රටාව ආදී බොහෝ දේ පිළිබඳ තොරතුරු සහෝදරයා හා බෙදා හදා ගත්තා ය.
මෙසේ සංස්කෘතීන් පිළිබඳ අවබෝධ කර ගැනීම අයත් වන්නේ,
(1) ගෝලීය සංස්කෘතියට ය.
(2) ජනප්‍රිය සංස්කෘතියට ය.
(3) ජන සංස්කෘතියට ය.
(4) සාම්ප්‍රදායික සංස්කෘතියට ය.
(5) අන්තර් සංස්කෘතික අධ්‍යයනයට ය.

49. ජනශ්‍රැති සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශයක් **නොවන්නේ,**
   (1) ජනශ්‍රැති පාරම්පරික ඥාන සම්භාරයකි.
   (2) ජනශ්‍රැතිය නූතන ජනතාවගේ ඥානය ලෙස වර්ධනය වූවකි.
   (3) ජනශ්‍රැතිය මුඛ පරම්පරානුගතව කලක් තිස්සේ පැවත එන සාම්ප්‍රදායික ඥානයකි.
   (4) මාධ්‍ය සන්දේශ නිර්මාණාත්මකව ගොඩනැගීම සඳහා ජනශ්‍රැති ප්‍රබල ලෙස භාවිත කළ හැකි ය.
   (5) ඉතිහාසය හා ආගම සමග බද්ධ වීම හේතුවෙන් ජනශ්‍රැති කෙරෙහි විශ්වසනීයත්වය ගොඩනැගේ.

50. විද්‍යාපීඨ සඳහා බඳවා ගැනීම් මෙවර ගැසට් නිවේදනයෙහි ඇති බව පන්තිභාර ගුරුවරයා පැවසූ බව සුනිමල් සිය සොහොයුරාට දන්වී ය. මෙම ප්‍රකාශයෙහි අන්තර්ගත සන්නිවේදන ස්වරූප පිළිබඳ නිවැරදිව දැක්වූ පිළිතුර වන්නේ,
   (1) විධිමත් හා වාචික සන්නිවේදනයට ය.
   (2) ලිඛිත සන්නිවේදනයට හා විධිමත් සන්නිවේදනයට ය.
   (3) අවිධිමත් හා වාචික සන්නිවේදනයට ය.
   (4) කථන හා විධිමත් සන්නිවේදනයට ය.
   (5) අවිධිමත් හා ලිඛිත සන්නිවේදනයට ය.